# ජනමාධ්‍යවේදීන් ඝාතනය කිරීම් සහ හිංසනයට ලක්කිරීම් සම්බන්ධයෙන් නව සාහසික තත්ත්වයක්

**ජනමාධ්‍යවේදීන්ට එරෙහි හිංසනය සහ අපරාධ අවසන් කිරීමේ ජාත්‍යන්තර දිනය (නොවැ 02) නිමිත්තෙන් ජගත් පුවත්පත් සහ පුවත් ප්‍රකාශකයින්ගේ සංගමය කියයි**

**ජනමාධ්‍යවේදීන් නිහඬ කිරීමට මාධ්‍යයට තර්ජනය කිරීමට හෝ මහජනතාවට තොරතුරු ලබාදීමේ අපගේ කාර්යභාරයට අවමන් කිරීමට උත්සාහ දරන්නන් හට සාමාන්‍ය කටයුත්තක් විය හැකි වුව ද පසුගිය සති කිහිපයේ දී ගෝලීය වශයෙන් දක්නට ලැබුනේ වරදකරුවන්ට නීතිය ඉදිරියේ දඬුවම් නොලැබීයාමට එරෙහි සටනට සහායදීම සඳහා නිරන්තරයෙන් ක්‍රියා කරන වෘත්තියකට එල්ල වූ නව මට්ටමක ප්‍රවනතාවයකි.**

**යුරෝපයේ දූෂණ ක්‍රියාවන් හෙළිදරව් කිරීම, ඇමෙරිකා එක්සත් ජනපදයේ මුසාවන් එළිදරව් කිරීම හෝ ඉතා පැහැදිලිව පෙනී යන සවුදි රජය අනුමත කළ ඝාතනයක් සම්බන්ධයෙන් යුක්තිය ඉටු වන බවට සහතික කිරීම ආදී වශයෙන් වුව දල සත්‍ය සුරක්ෂිත කිරීම හා ආරක්ෂා කිරීම සඳහා බලය ලත් ආයතන විසින්ම සත්‍ය කෙළසීමට හා විකෘති කිරීමට දරන අප්‍රතිහත උත්සාහයන්ගෙන් ලෝව පුරා ජනමාධ්‍යවේදීන්ට අඛණ්ඩව තර්ජන එල්ල වේ.**

පසුගිය සති කීපයේ දී ඇති වූ වෙනස් සිදුවීම් තුනක් අප මුහුණපා ඇති බරපතළ තත්ත්වය පෙන්නුම් කරයි.

■ ජමාල් ඛෂෝගි ඉස්තාම්බුල් හි පිහිටි සවුදි අරාබි තානාපති කාර්යාලයට ඇතුළු වූ අතර ඔහුගේ රාජ්‍යයෙන්, එරට ඔහුගේ දෘෂ්ටි කෝණයට කොතරම් දැඩිව විරුද්ධ වුව ද, ඔහුට ලබා දීමට බැඳී සිටි කිසිදු ආරක්ෂාවක් හිමි නොවීය. සවුදි රාජ්‍ය නිලධාරීන් විසින් ඔහුගේ අතුරුදහන්වීම සිදු කළ බියකරු ආකාරය සහ පැහැදිලිවම පෙනී යන ඝාතනය මගින් හෙළිදරව් කරන්නේ සත්‍ය ප්‍රකෘත්තිමත් කිරීම සඳහා අඟලක් හෝ ඉදිරියට කටයුතු කර නොමැති, ප ්‍රතිවිරුද්ධ මතවාද මුළුමනින්ම තුරන් කිරීමට ඕනෑම දෙයක් සිදු කිරීමට නොපැකිලෙන රාජ්‍ය තන්ත්‍රයකි.

■ මෝල්ටානු රජය 2017 ඔක්තෝබර් මාසයේ දී සිදු වූ ඩැෆ්නි කරුආනා ගලීෂියාගේ මරණය සම්බන්ධයෙන් මහජන විමසුමක් පැවැත්වීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලීම් අඛණ්ඩව ප ්‍රතික්ෂේප කළේ ඇතැම් විට එවැනි පරීක්ෂණයකින් අනාවරණ කළ හැකි දේ පිළිබඳ බියවීම හෝ එම රජය දැඩි ලෙස විවේචනය කළ තැනැත්තෙක් සඳහා අවශ්‍ය ආරක්ෂාව සැලසීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් නොසැලකිලිමත්වීම පිළිබඳ චෝදනා එල්ලවනු ඇතැයි සැක කිරීම හේතුවෙන් විය හැකිය.

- ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පත් කළ සෙනෙට් නියෝජිතයෙක් විසින් පත්‍රකලාවේදියෙක්ට ප්‍රචණ්ඩකාරී ලෙස ප්‍රහාර එල්ල කිරීම සමරමින් අඛණ්ඩව මාධ්‍ය විරෝධී මතවාද ඉදිරිපත් කළේ මාධ්‍යයට එරෙහි ඔහුගේ එදිරිවාදී ආකල්ප නිරූපණය කරන බියකරු එමෙන්ම බෙදවාචක තත්ත්වයක් නිරූපණය කරමිනි.

බලය සහ එහි වගවීම සහතික කරවන ජනමාධ්‍යවේදය අතර ඇති සම්බන්ධතාව සෑම විටකම පහසු සබඳතාවක් වී නොමැත. එය එසේ වීමට ද අවශ්‍ය නැත. අපි කටයුතු කරන්නේ ගුණ වැනීමට, සතුටු කිරීමට හෝ යටත්පහත් අනුමැතිය සැලසීමට හෝ නොවේ. අපි අපරාධ හා අයුතු ක්‍රියා නොදැක්කා සේ සිටීමට, විශ්වාසනීය චෝදනා නොසලකා හැරීමට හෝ මහජන සුබසිද්ධිය පිළිබඳ විමර්ශන සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට අපොහොසත්ව ඇත.

වෘත්තීය දේශපාලනඥයින්, ජනප්‍රියවීමට වෙර දරන පුරසාරම්කරුවන් හා කෝපය දනවන ආයතනික බලධාරීන් ආදීන්ගේ අසතුටට හේතුවක් වෙමින් සෝෂාකාරී, නොපසුබසින හා ධෛර්යසම්පන්න මාධ්‍ය අඛණ්ඩවම මිත්‍රශීලී නොවූ ස්ථානවලට පවා සිය උකුසු ඇස යොමු කරයි. නමුත් එසේ කිරීමෙන් ඔවුන්ට විඳීමට සිදු වන පාඩුව ද සුළුපටු නොවේ. මහජන සුබසිද්ධිය සඳහා වන ජනමාධ්‍යවේදයේ ඉදිරියෙන්ම සිටින පත්‍රකලාවේදීන්ට පෙර කිසි දිනක දී නොවූ තරම් අනතුරුදායක පරිසරයක සිය රාජකාරි කටයුතු ඉටු කිරීමට සිදු වී ඇති අතරම රාජ්‍ය සංස්ථාව ද ඔවුන් වෙනුවෙන් කටයුතු කිරීම මගහැර ඇත්තේ පෙර නොවූ විරූ පරිදිය.

නොවැම්බර් මස 02 වැනි දිනට එළැඹෙන ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සහ හිංසනය අවසන් කිරීමේ ජාත්‍යන්තර දිනය ලෝකය පුරාම සමරනු ලබන්නේ ජනමාධ්‍ය වෘත්තියේ ප්‍රගමනය සම්බන්ධයෙන් ඉතිසාහයේ පෙර කිසි දිනක නොතිබුනු තරම් තර්ජන ඉතා පුළුල් වශයෙන් එල්ල වෙමින් ඇති වකවානුවක දීය. ජනමාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ කරුණේ දී ජනමාධ්‍යවේදීන්ගේ නොවිසඳුනු ඝාතනය කිරීම් (1992 වසරේ සිට සිදු වූ ඝාතන 848 කට අධිකය) සම්බන්ධයෙන් දඬුවම් නොලැබීයාම තවදුරටත් සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන කරුණකි. වාර්තා වූ ඝාතන දහයකින් නමයක්ම නොවිසඳුනු ඝාතන වන අතර මෙම මහත් කම්පාකරවන සංඛ්‍යාත්මක අගය අඩු කර ගැනීම සඳහා හදිසි විසඳුම් ලබා ගැනීම පිණිස රජයේ, රාජ්‍ය ආයතනවල හා ගෝලීය සංවිධානවල සක්‍රීය දායකත්වය ලබා ගැනීම ඉලක්ක කර ගත් උත්සාහයන් වෘත්තීය තුළ උත්තේජනය කරවන තත්ත්වයකි.

හිංසනයට ගෞරවාන්විත විසඳුම් සෙවීම පිණිස වූ ව්‍යායාම එම තත්ත්වය නිරන්තර විනාශයක් බවට පත්ව ඇති රටවල බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක වන අතිශය ප්‍රායෝගික හා දැඩි අවශ්‍යතාවක් වන ඉලක්ක හඹායාමකි. අන්තර්ජාතික ප්‍රකාශන හා ජනමාධ්‍ය වෘත්තියේ නියැලෙන ඕනෑම ස්ථානයක දී ඔවුන්ගේ ආරක්ෂාව විධිමත් කිරීම හා සම්බන්ධීකරණය සඳහා වූ උත්සාහයන්ගෙන් අනුබලය ලද  පොලිසි හා ආරක්ෂක බලසේනා ශක්තිමත් කිරීම, අධිකරණ පද්ධති පුහුණු කිරීම හා නීතියේ පාලනය දිරිමත් කිරීම වැනි පියවර අවශ්‍යතාවයන්හි ප්‍රබලත්වය දිනෙන් දිනම වර්ධනය වෙමෙන් පවතී.

කෙසේවුව ද දඬුවම් නොලැබී යාමට එරෙහිව ඉතා වෙහෙසකරව අත්කර ගත් ජයග්‍රහණ රාශියක් ආපසු හරවනු පමණක් නොව ඒවා සුනු විසුණු කරන වර්තමාන දේශපාලන පරිසරය සම්බන්ධයෙන් ගත් කළ මේවා සියල්ල පල රහිත ව්‍යායාම විය හැකිය.

ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් දඬුවම් නොලැබීයාම පිළිබඳව විසඳුම් සෙවීම සඳහා වූ දේශපාලන අභිලාෂයක් නොමැති වීම මෙම ගැටළුව සැලකිය යුතු ලෙස අවම කිරීම සම්බන්ධයෙන් මුහුණ දෙන ප්‍රධාන බාධකය වී ඇත. විවෘත නඩු කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන් මූලික තොරතුරු පවා හෙළිදරව් කිරීමට, සාර්ථක විමර්ශන සඳහා අවශ්‍ය කරන සම්පත් සැපයීමට නොකැමතිවීම සහ අපරාධකරුවන් නීතියේ රැහැනට කොටු කර ගැනීමට පමණක් නොව වඩා වැදගත් ලෙස, ඝාතන පිටුපස සැඟවී සිටින (ඉහළ නිලධාරීන් හෝ ප්‍රබල දේශපාලන සබඳතා ඇති පුද්ගලයින් බවට බොහෝවිට සැක කරන) මහ මොළකරුවන් අල්ලා ගැනීමට ඇති දුර්වල කැපවීම පත්‍රකලාවේදීන් පුහුණු කිරීම හා ආරක්ෂක පියවර හා ප්‍රවෘත්ති කාමර සිරිත් විරිත් වැඩිදියුණු කිරීම සඳහා වූ ස්ථානගත ව්‍යායාමවලට එරෙහිව අඛණ්ඩව ක්‍රියාත්මක වන තත්ත්වයකි.

ආරක්ෂිත පරිසරය වැඩිදියුණු කිරීමට වගකීම පැවරී ඇති සෑම පාර්ශ්වකරුවෙක්ම ඉටු කළ යුතු කාර්යභාරයක් ඇත. නමුත් මෙකී සියලූම ව්‍යායාමයන් තිබියදීත් වචනාර්ථයෙන් මෙන්ම ක්‍රියාවෙන් ද තම පාර්ශ්වයේ වගකීම ඉටු කිරීමට පූර්ණ කැපවීම ඇති රාජ්‍ය අංශය නොමැතිව පවතින තත්ත්වය වැඩිදියුණු කර ගැනීම සඳහා වෙනස් කළ හැකි දේ ඉතා සුළුය.

කෙසේවුව ද, වෙනත් පාර්ශ්වයක් සාහසික ඝාතන සැලැස්මක් හෝ ප්‍රචණ්ඩකාරී පරිසරයක් සාමාන්‍යකරණයක් සම්බන්ධයෙන් දඬුවම් නොලැබීයාමක් සිදු වන බවට රාජ්‍ය නිරීක්ෂණය කරන විට වගවීම පහළම මට්ටම දක්වා යළි පිහිටුවනු ලැබියයුතුය.

දඬුවම් නොලැබීයාමේ සංස්කෘතියට විරුද්ධව සටන් කිරීමේ සැබෑ උත්සාහයකට අනුකූලවීමේ ඉලක්කය වෙනුවට අපිට සවුදි අරාබිය, මෝල්ටාව හා ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු රටවල් රාශිය දක්නට ලැබෙන්නේ මෙම තර්කය අනතුරුදායක නව මානයකට රැගෙන යාමකි. සෝමාලියාව, සිරියාව, ඉරාකය, දකුණු සුඩානය, පිලිපීනය, මෙක්සිකෝව, පකිස්තානය, බ්‍රසීලය, රුසියාව, බංගලාදේශය, නයිජීරියාව හා ඉන්දියාව වැනි රටවල ආණ්ඩුවලින් ඔවුන්ගේ වාර්තා වඩා යහපත් බවට පමුණුවන ලෙසට සිදු කරන ඉල්ලීම් (2017 CPJ ගෝලීය දඬුවම් නොලැබීයාමේ දර්ශකය බලන්න) තවදුරටත් දැඩි වන අතරම වැඩි වශයෙන් අසාර්ථක වෙමින් ඇත.

එමෙන්ම යුක්තිය ඉටුවීමේ සුළු හෝ බලාපොරොත්තුවක් නොමැතිව ජනමාධ්‍යවේදීන් තවදුරටත් මරණයට පත් වෙති එය එතරම්ම සරල දෙයකි.

මෑතක දී සිදු වූ සිදුවීම් තුන පෙන්වා දෙන්නේ ජනමාධ්‍යවේදීන් ඉලක්ක කරන තැනැත්තන් හට එම කාර්යයන් සාමාන්‍යය තත්ත්වයටත් වඩා හොඳින් සිදු කළ හැකි බවයි. දඬුවම් නොලැබීයාමට එරෙහි සටනේ දී රාජ්‍ය වගවීම පිළිබඳ සංකල්පය ඔවුන් තවදුරටත් යටපත් කරයි.

එහි භූදේශපාලන, ආර්ථික හා ආගමික බලපෑම හරහා පත්‍රකලාවේදීන් සඳහා ඉතා අන්තරාදායක කලාපයක් වන සවුදි අරාබිය මිලියන ගණන් ජනතාවක් සඳහා ජීවන ක්‍රමයක් තීරණය කරන පරිසරයක් නිර්මාණය කරයි. සීමා නොකරන ලද ඒකාධිපතිවාදය එහි පාලකයින්ට තමන් නීතියේ පාලනයට ඉහළින් සිටින බවට හැඟීමක් ඇති කර තිබෙන නමුත් ජමාල් ඛෂෝගිගේ මරණය වෙනුවෙන් වගකිව යුත්තන් නීතිය හමුවට පමුණුවීමට ලෝකය අපොහොසත් වුවහොත් මානව හිමිකම් සහ නිදහස වෙනුවෙන් කලාපය තුළ පැන නැගී ඇති ප්‍රබල ඉල්ලීම නිෂ්පල වනු ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කර සත්‍ය හෙළිදරව් කිරීම පිණිස පත්‍රකලාවේදීන් සිරගත කිරීම සම්බන්ධයෙන් ලෝකයේ ඉහළම නරක නාමය දිනා ඇති සහ නිදහස් මාධ්‍යයක පැවැත්ම සඳහා කිසිදු හිතකර වාතාවරණයක් නොමැති තුර්කිය මත විශ්වාසය තැබීම දැඩි සංවේගයට කරුණකි.

මෙයට සමාන ලෙස, මෝල්ටාවේ සිදුවීම නිදහස් මාධ්‍යයක් දිරිමත් කිරීම සම්බන්ධයෙන් සමස්ත යුරෝපයේ ඇති පරමාදර්ශය පරීක්ෂණයට භාජනය කරවන වාතාවරණයකි. විනිවිදභාවය හා වගවීම සඳහා බියක් ඇති ප්‍රජාතාන්ත්‍රිකව පත් කළ ආණ්ඩුවකින් තමන්ගේම අසමත්කම් ඇගයීමට යුරෝපය විසින් භාවිතා කරන කැඩපත කිළිටි වී ඇත්තේ නම් එහි දේශසීමාවලින් බැහැර විදේශ ප්‍රතිපත්ති සඳහා වූ යුරෝපයේ මානව හිමිකම් පාදක ප්‍රවේශය තවදුරටත් පිරිහීයාමේ අවදානමක් ඇත.

වර්තමාන පාලන තන්ත්‍රය යටතේ ඇමෙරිකා එක්සත් ජනපදයට (මාධ්‍ය නිදහස සහ අන්තර්ජාතික මානව හිමිකම් පිළිබඳ ක්ෂේත්‍ර රාශියක් ඇතුළුව) ගෝලීය නායකත්වයේ හා අධිකාරියේ වැඩි පංගුවක් අහිමිව ඇති බැවින් මාධ්‍ය නිදහසේ සුරක්ෂිතතාව සඳහා 'රන් ප්‍රමිතිය' ලෙස ලොව පුරා අගය කිරීමට ලක් වූ පළමු සංශෝධන හිමිකම්වලින් (First Amendment Rights) අවම වශයෙන් ලෝකය දෙස බැලීමේදී පහරදීම් වැළක්වා ගත හැකි බවට සහතික කළ නොහැක. යුද්ධයේ නියැලි ප්‍රධාන අණදෙන නිලධාරියෙක්ගේ වචන අනුව සහ ජනමාධ්‍යවේදීන්ට පහර දෙන අපරාධකරුවන් මම කැමති වර්ගයේ හාදයින්, ලෙස හැඳින්වීම හරහා මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇත්තේ හීන වූ සැලකිල්ලක්

වන බවට වූ හුදු සංකල්පනය සංවේගයට කරුණකි. මෙහි ඉතාම නරක තත්ත්වය වන්නේ ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති ධූරයේ ආදර්ශය ලබා ගෙන ඒ අනුව යමින් ඒකාධිපති පාලකයින් හට බිහිසුණු ප්‍රතිවිපාක ඇති තමන්ගේම න්‍යායපත්‍ර අනුව කටයුතු කිරීම සඳහා අවසරයක් ලැබෙන බැවිනි.

මේ කිසිවක් ජනමාධ්‍යවේදීන්ට විරුද්ධව සිදු වන අපරාධ සම්බන්ධයෙන් දඬුවම් නොලැබීයාමට එරෙහි සටනේ කිසිදු ප්‍රගතිගාමී පියවරක් නොවේ. මාධ්‍ය නිහඬ කරවීම සඳහා වූ සාහසික උත්සාහයන් කිසිදු අලූත් දෙයක් නොවේ. එමෙන්ම ජනමාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම පිණිස ඇතැම් රාජ්‍යයන්ගේ හෝ ඒවායේ නායකයින්ගේ නොසලකා හරින සුළු ආකල්ප ද සත්‍ය වශයෙන්ම අලූත් තත්ත්වයන් නොවේ. අවම වශයෙන්, මෑත කාලීන විකාශනයන් සමග තිරය මෑත් වී ඔවුන්ගේ සැබෑ ස්වරූපය හෙළිදරව් වී ඇත. ව්‍යාජ රගපෑම් අවසන් කිරීමට කාලය එළැඹ ඇත. ඇතැම් විට මෙය තත්ත්වය සදහටම ඉදිරියට ගෙනයාමට හේතුවක් වනු ඇත.

ඇන්ඩෘ හෙස්ලොප්
මාධ්‍ය නිදහස පිළිබඳ අධ්‍යක්ෂ
ජගත් පුවත්පත් සහ පුවත් ප්‍රකාශකයින්ගේ සංගමය